**සෞන්දර්යය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය- 2010**

---------------------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සෞන්දර්යය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට සෞන්දර්යය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයෙ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරනනා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන යහපාලනය සඳගා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයේ සෞන්දර්යය අධ්‍යාපනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද 2011 මාර්තු 16 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1:2:2 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.23,784,462 ක් වූ ස්ථාවර වත්කම් වටිනාකම පොත් අගය මත පදනම්ව තිබුණි. මුදල් රෙගුලාසි 756 පකාරව සමාලෝචිත වර්ෂය අවසානයට මෙම වත්කම් පිළිබඳ භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ආ) කලින් තිබි ස්වාමි විපුලානන්ද සංගීත හා නැටුම් විද්‍යාලයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) රාජකාරි ගමන් සඳහා පොදු ප්‍රවාහන පහසුකම් යොදා ගැනීම වෙනුවට නිලධාරීන් කිහිප දෙනෙකුට රු.83,062 ක් වූ වාහන ගාස්තු ප්‍රතිපූර්ණයන් කර තිබුණි.

1:2:3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.782,849 ක් වු විවිධ අත්තිකාරම් තහවුරු කර ගිණුම් පොත්වල නිරවුල් කිරීමෙන් තොරව, 2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) විපුලානන්ද උත්සව දිනයට අදාල රු.15,752 ක් වූ අරමුදල් තහවුරු කර හෝ ගිණුම් පොත්වලින් නිරවුල් කිරීමට පියවර ගැනීමෙන් තොරව, ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඇ) රු.43,356 ක් වූ රඳවා ගැනීම් මුදල් පියවීමට හෝ ගිණුම් පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කිරීමෙන් තොරව 2008 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට ගෙවිය යුතු රු.1,207,583 ක් වූ ණය ශේෂයන් නිරවුල් කිරීම සඳහා ආයතනයෙ කාර්ය මණ්ඩලයෙන් 2010 වර්ෂය තුළදී අයකරගත් රු.357,089 ක් වූ ණය අයකර ගැනීම් ශ්‍රී ලංකා නැගෙනහිර විශ්ව විද්‍යාලයට ප්‍රේෂණය කර නොතිබුණි.

1:2:4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.712,808 ක් වූ වෙනත් වියදම්වලට අදාල විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) රු.376,257 ක් වූ ගෙවීම් වවුචර් 17 ක් ආයතනයේ අධ්‍යක්ෂ විසින් මුදල් රෙගුලාසි 136 ප්‍රකාරව අනුමත කර නොතිබුණි.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------------

**2:1 මූල්‍ය සමාලෝචනය**

---------------------

**2:1:1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ වැඩ කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා රු.30,829,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පසු රු.1,484,826 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ රු.19,190,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පසුව ඌනතාවය රු.5,148,286 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,663,460 ක වර්ධනයක් දැක්වුණි.

**2:2 කාර්ය සාධන සමාලෝචනය**

-------------------------------

**2:2:1 අධ්‍යයන කාර්ය සාධනය**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පවත්වන ලද විභාග

------------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද විභාග පිළිබඳ විස්තර පහත දැක්වේ.

| පීඨය | විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | ඌන සාමාර්ථ ලැබූ / අසමත් වූ සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| සංගීතය | 98 | 76 | 22 |
| නැටුම් | 67 | 34 | 33 |
| නාට්‍ය හා වේදිකා | 94 | 65 | 29 |
| දෘශ්‍ය හා තාක්ෂණික | 46 | 23 | 23 |

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

---------------------

ආයතනයේ පාඨමාලා 4 ක් සඳහා ලියාපදිංචි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 529 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.32,822,560 ක් විය. සමාලෝචිත වර්ෂය තුළදී එක් ශිෂ්‍යයෙකුට සාමාන්‍ය පුනරාවර්තන පිරිවැය රු.62,046 ක් විය.

(ඇ) මහපොළ හා ශිෂ්‍යාධාර

-------------------------

ශිෂ්‍යයින් 451 දෙනෙකුට මූල්‍යාධාර ලෙස රු.8,918,000 ක් හා ශිෂ්‍යයින් දෙදෙනෙකුට මහපොළ ආධාර ලෙස රු.32,500 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි.

## 2:3 ප්‍රසම්පාදන

------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.7.7 වගන්තිය ප්‍රකාරව සාමාජිකයන 03 දෙනෙකු වෙනුවට 2008 මාර්තු 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, ආයතනයේ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව සාමාජිකයන් 4 දෙනෙකුගෙන් සමන්විත විය.

(ආ) ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ (RPC) අනුමැතිය මත රැස්වීම් කමිටු සටහනවල මිලදී ගතයුතු විෂය සංඛ්‍යාව සඳහන් කිරීමෙන් තොරව රු.6,722,991 ක වටිනාකමට භාණ්ඩ හා උපකරණ මිලදී ගෙන තිබුණු අතර, පසුව උකුලපතිවරයාගේ ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ඇ) එකක් රු.5,778 බැගින් වයර් සමඟ ශබ්ද වාහිනී යන්ත්‍ර 11 ක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික සැපයුම්කරුවකුට රු.63,558 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 - ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.14.1 වගන්තිය ප්‍රකාරව ටෙන්ඩර් / මිල කැඳවීම් පරිපාටිය අනුගමනය කිරීමෙන් තොරව 2010 අගෝස්තු 30 දින වයර් සමඟ මයික්‍රොෆෝන් 11 ක් මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද, 2011 ජනවාරි 07 දින ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණේ මයික්‍රොෆෝන් 06 ක් සඳහා පමණි.

(ii) "අනුජා" වර්ගයේ උපකරණ සඳහා බලයලත් නියෝජිතවරයෙකු නොවන ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකුගෙන් ඉහත උපකරණ මිලදී ගෙන තිබුණි.

## 2.4 මූල්‍ය කළමනාකරණය

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැපයුම් කිහිපයකට අදාලව ලියන ලද රු.5,804,179 ක් වටිනාකම වූ චෙක්පත් 43 ක් අදාල සැපයුම්කරුවන්ට සෘජුවම තැපැල් කරනු වෙනුවට ආයතනයේ ගබඩා භාරකරු හා ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී (SAB) විසින් පෞද්ගලිකව ලබා ගෙන සැපයුම්කරුවන්ට නිකුත් කර තිබුණි.

(ආ) විවිධ කාරණයන් සඳහා අවස්ථා 07 කදී ලබා දෙන ලද එකතුව රු.96,055 ක් වූ අත්තිකාරම් අදහස් කළ කාරණයන් සඳහා යොදා නොගෙන සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

## 3. පද්ධති හා පාලන

--------------------

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම් හා ඉනවෙන්ටරි විෂයයන්

(ආ) ප්‍රසම්පාදන

(ඇ) ගිණුම්කරණය